OL/2017/84/S-I, II (OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

84 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | | |
|---|---|---|
| ශිල්ප කලා | I, II | පැය තුනයි |
| நுண்கலை | I, II | மூன்று மணித்தியாலம் |
| Arts and Crafts | I, II | *Three hours* |

## ශිල්ප කලා I

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**


(iv) එම උත්තර පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** විවිධ අවශ්‍යතා මුල් කරගනිමින් බිහි වූ ජනකලා වර්ග කර දැක්වීමේ දී ශ්‍රව්‍ය කලා හා දෘශ්‍ය කලා යන අංග දෙකම ඇතුළත් ජනකලා ලෙස සැලකෙන්නේ,
(1) ලාක්ෂා කර්මාන්තය සහ රේන්ද කර්මාන්තයයි.
(2) ලී කෙලි නැටුම් සහ කෝලම් රංගන කලාවයි.
(3) දුම්බර පැදුරු කලාව සහ පිත්තල කර්මාන්තයයි.
(4) බලි තොවිල් කලාව සහ වඩු කර්මාන්තයයි.


**2.** වෘත්ත ඛණ්ඩයක් යනුවෙන් අදහස් කෙරෙන්නේ වෘත්තයක කිනම් කොටසක් ද?
(1) ජ්‍යායකින් සහ චාපයකින් සීමා වූ කොටස ය.
(2) අරයන් දෙකකින් සහ චාපයකින් සීමා වූ කොටස ය.
(3) විෂ්කම්භයකින් හා චාපයකින් සීමා වූ කොටස ය.
(4) විෂ්කම්භ දෙකකින් හා චාපයකින් සීමා වූ කොටස ය.

**3.** විහිත චතුරස්‍ර යුගල භාවිතයෙන් නිර්මාණය කළ හැකි කෝණ පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) 15° ගුණාකාරවලින් යුතු කෝණ නිර්මාණය කළ හැකි ය.
(2) 90° වඩා වැඩි සියලුම කෝණ නිර්මාණය කළ හැකි ය.
(3) 30° ගුණාකාරවලින් යුතු කෝණ නිර්මාණය කළ හැකි ය.
(4) ඕනෑම කෝණයක් නිවැරදිව ඇඳීමට භාවිත කළ හැකි ය.

**4.** මෙහි දැක්වෙන්නේ සවිධි පංචාශ්‍රයකි. මෙහි අභ්‍යන්තර කෝණයක අගය වන්නේ,
(1) 120° කි. (2) 180° කි.
(3) 130° කි. (4) 108° කි.




**5.** පහත දැක්වෙන ඉලිප්සාකාර නිර්මාණයේ මෝස්තරය විහිදී ඇත්තේ ඉලිප්සයක ප්‍රධාන අංගයක් ඇසුරු කරගෙන ය. එම සුවිශේෂී අංගය වන්නේ,
(1) අරයයි.
(2) මහා අක්ෂයයි.
(3) සුළු අක්ෂයයි.
(4) විෂ්කම්භයයි.



[දෙවැනි පිටුව බලන්න.


Department of Examinations Sri Lanka

**6.** රූපයේ පෙන්වා ඇති ජ්‍යාමිතික හැඩතලයේ CB විකර්ණ රේඛාව දෙපස පිහිටි ත්‍රිකෝණ වර්ගය කුමක් ද?




(1) විෂමපාද ත්‍රිකෝණය
(2) සමපාද ත්‍රිකෝණය
(3) සෘජුකෝණී ත්‍රිකෝණය
(4) සමද්විපාද ත්‍රිකෝණය

**7.** මෙම රූපයේ දැක්වෙන්නේ ත්‍රිකෝණයක පාද තුනම ස්පර්ශ වන සේ අඳින ලද වෘත්තයකි. මෙම නිර්මාණයේ දී වෘත්තයේ කේන්ද්‍රය නිවැරදිව ලබා ගැනීමට කළ යුත්තේ,





(1) කෝණ සම්ච්ඡේදක ඡේදනය වන ලක්ෂය කේන්ද්‍ර කරගෙන වෘත්තය ඇඳීම ය.
(2) පාද සම්ච්ඡේදන ලක්ෂය කේන්ද්‍ර කරගෙන වෘත්තය ඇඳීම ය.
(3) *B* සිට *AC* රේඛාවට අඳිනු ලබන ලම්බකයේ උසින් අඩක් භාවිත කර වෘත්තය ඇඳීම ය.
(4) ඕනෑම පාදයක් සමච්ඡේදනය කර ඉන් අඩක් ගෙන වෘත්තය ඇඳීම ය.

**8.** ඇඳීමේ කඩදාසිවල (Drawing paper) ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව කඩදාසි වර්ග කර ඇත්තේ,


(1) 420 mm × 954 mm ලෙසට ය.
(2) 297 mm × 420 mm ලෙසට ය.
(3) 105 mm × 148 mm ලෙසට ය.
(4) 841 mm × 1189 mm ලෙසට ය.

**9.** මෙම රූපසටහනේ දැක්වෙන්නේ,




(1) රේඛාවක් සමාන කොටස්වලට බෙදීම ය.
(2) රේඛාවකට ලම්බරේඛා ඇඳීම ය.
(3) රේඛාවකට සිරස් රේඛා ඇඳීම ය.
(4) රේඛා සම්ච්ඡේදනය කිරීම ය.

**10.** රූපයේ දැක්වෙන නිර්මාණයෙහි පෙන්නුම් කරන්නේ,




(1) *A* ලක්ෂ්‍යයේ දී *AB* රේඛාව සමග සෘජුකෝණයක් නිර්මාණය කිරීම ය.
(2) කෝණයක් සමාන කොටස් තුනකට වෙන් කිරීම ය.
(3) *DB* රේඛාවට ලම්බ සමච්ඡේදකයක් නිර්මාණ කිරීම ය.
(4) *DB* රේඛාවට *AC* සමච්ඡේදකය නිර්මාණ කිරීම ය.

**11.** මූලික වර්ණ දෙකක් සම්මිශ්‍රණයෙන් ද්විතීයික වර්ණයක් ගොඩනැගෙයි. කොළ වර්ණය ලබා ගැනීම සඳහා මිශ්‍ර කළ යුතු මූලික වර්ණ දෙක වනුයේ,

(1) නිල් සහ රතු ය.
(2) කහ සහ රතු ය.
(3) කහ සහ නිල් ය.
(4) රෝස සහ නිල් ය.

**12.** වර්ණ ආලෝකකරණයේ විවිධ ක්‍රම භාවිතයේ පවතී. මෝස්තරයේ ගැඹුර හා ත්‍රිමාණත්වය ගොඩනැගීම සඳහා කළ යුතු වන්නේ,

(1) යටි ආලේපනයයි.
(2) අඳුරුකරණයයි.
(3) අධි ආලෝකකරණයයි.
(4) වර්ණ සේදුමයි.

**13.** පින්තාරුකරණයේ දී පින්සල් හඳුනාගනු ලබන්නේ අංකයට අනුව ය. පින්සල්වලට අංක ලබා දෙන්නේ,


(1) පින්සල් සකස්කර ඇති හැඩය අනුව ය.
(2) පින්සලෙන් කෙරෙන කාර්යය පදනම් කරගෙන ය.
(3) යොදා ඇති කෙඳි වර්ගය අනුව ය.
(4) යොදන ලද කෙඳි ප්‍රමාණය අනුව ය.

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka


**14.** සායම් භාවිතයෙන් තොරව කෙරෙන රෙදිපිළි අලංකරණ ක්‍රම වර්තමානයේ බහුලව භාවිත කෙරේ. සායම් වර්ග භාවිත **නොකොට** කරන රෙදිපිළි අලංකරණ වන්නේ,
(1) නෙට්වර්ක් ක්‍රමය සහ අච්චු මුද්‍රණ ක්‍රමයයි.
(2) තාප බන්ධිත ක්‍රමය සහ පැච්වර්ක් ක්‍රමයයි.
(3) රිබන් නිර්මාණ සහ අතින් පින්තාරු ක්‍රමයයි.
(4) එම්බ්‍රොයිඩර් ක්‍රම සහ සිදුරු තහඩු ක්‍රමයයි.

**15.** රූපයේ දැක්වෙන්නේ එක්තරා පිළි අලංකරණ ක්‍රියාවලියක දී සායම් ආලේප කරන ආකාරයයි. මෙසේ සායම් ආලේප කරනු ලබන්නේ,
(1) ස්ටෙන්සිල් මුද්‍රණ ක්‍රියාවලියේ දී ය.
(2) තහඩු මුද්‍රණ ක්‍රියාවලියේ දී ය.
(3) තිරරාමු මුද්‍රණ ක්‍රියාවලියේ දී ය.
(4) අච්චු මුද්‍රණ ක්‍රියාවලියේ දී ය.




**16.** පිළි මුද්‍රණයේ දී භාවිත කරන අලංකරණ ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A - අතින් පින්තාරු කිරීම
B - තිරරාමු මුද්‍රණය
C - අච්චු මුද්‍රණය
D - සිදුරු තහඩු මුද්‍රණය



මෙම රූපයේ දැක්වෙන සිතුවම සඳහා යොදාගත හැකි අලංකරණ ක්‍රම වන්නේ,
(1) A සහ B ය. (2) A, B සහ C ය.
(3) B, C සහ D ය. (4) A, B, C සහ D ය.

**17.** පිළි අලංකරණ ක්‍රමවේද සඳහා විවිධ උපකරණ භාවිතයට ගැනේ. මෙම රූපයේ දැක්වෙන උපකරණ අවශ්‍ය වනුයේ,
(1) බතික් අලංකරණ ක්‍රමයේ දී ය.
(2) තාප බන්ධික ක්‍රමයේ දී ය.
(3) තිරරාමු මුද්‍රණ ක්‍රමයේ දී ය.
(4) සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමයේ දී ය.



**18.** ස්වභාවික නෙළුම් අලයක හරස්කඩක් භාවිතයෙන් පිළි අලංකරණයේ දී කරනු ලබන මුද්‍රණ ක්‍රියාවලියක පියවර පහත දැක්වේ.
A - අච්චු භාවිත කර රටාවකට මුද්‍රා තැබීම
B - මුද්‍රණ පෑඩය මත අච්චුව තෙරපා අච්චුව මත සායම් ගැල්වීම
C - පෑඩ් කරන ලද මේසයේ රෙදිකඩ සවිකර ගැනීම
D - වියළෙන්නට තැබීම



ඒවායේ නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය කුමක් ද?
(1) A, B, C, D (2) A, B, D, C
(3) B, C, A, D (4) C, B, A, D

**19.** නිෂ්පාදිත රෙදි අලංකරණයට පෙර එහි ඇති අපද්‍රව්‍ය ඉවත් කර පිරිසිදු කරගත යුතු ය. පෙර පිරියම්කරණයේ එක් අවස්ථාවක් වන විරංජනයේ දී සිදු කෙරෙන්නේ,
(1) ස්වභාවික ව පවතින ලිග්නින්, පෙක්ටින් වැනි දෑ ඉවත් කිරීමයි.
(2) නිෂ්පාදන අවස්ථාවේ එකතු වූ මේද, ඉටි, දුහුවිලි ආදිය ඉවත් කිරීමයි.
(3) රෙදිවල ස්වභාවික ව පවතින දුඹුරු පැහැය ඉවත් කර ගැනීමයි.
(4) රෙදිවල ඉතිරි වී ඇති අපද්‍රව්‍ය රසායනික පිළිස්සීමකට ලක් කිරීමයි.

**20.** නූල් අංකන කිරීමේ දී තනිපට නූල් සඳහා එක් ක්‍රමයක් සහ දෙපට නූල් සඳහා තවත් ක්‍රමයක් ද භාවිත කෙරේ. නූල් අංක 2/40 නූල් කිලෝ එකක අඩංගු නූල් කැරළි ගණන වන්නේ,
(1) 40 කි. (2) 60 කි. (3) 80 කි. (4) 20 කි.

/හතරවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**21.** ස්වභාවික මූලද්‍රව්‍ය භාවිතයෙන් සකස් කෙරෙන නූල්, කැටීම මගින් ලබා ගන්නා ඒවා ය. අඛණ්ඩ සූත්‍රිකා නූල් හෙවත් සන්තතික නූල් ලෙස හඳුන්වන දිගින් වැඩි ස්වභාවික නූල් විශේෂය වන්නේ,
(1) සේද නූල් ය. (2) ලෝම නූල් ය. (3) කපු නූල් ය. (4) ලිනන් නූල් ය.


**22.** වොයිල්, වේට්ටි, චීත්ත, පොප්ලින්, මස්ලින් වැනි රෙදි වර්ග විවීමේ දී භාවිත කරන රටාව වන්නේ,
(1) සරළහීරි වියමන ය. (2) දික්දාර වියමන ය. (3) වාම් වියමන ය. (4) ජටා වියමන ය.

**23.** නූල් අංකනයේ දී නූල් වර්ගය අනුව සම්මත දිග තීරණය කර ඒ අනුව අංකනය කෙරේ. කපු නූල් කැරැල්ලක සම්මත දිග ලෙස සැලකෙන්නේ,
(1) මීටර 1000 ය. (2) යාර 560 ය. (3) මීටර 9000 ය. (4) යාර 840 ය.

**24.** විවීම් තාක්ෂණයේ දී හරස් නූල් යෙදීම සඳහා නූල් අංක $60^s$ ක තනිපට නූලක් භාවිත කරන්නේ නම් එම නූල් කිලෝග්‍රෑම් එකකට අඩංගු නූල් කැරළි ගණන වන්නේ,
(1) 30 කි. (2) 60 කි. (3) 80 කි. (4) 100 කි.

**25.** වියමන් රටාවක නූල් මතුකර ගන්නා ආකාරය අනුව රටාව නම් කර ඇත. පහත දැක්වෙන වියමන් රටා අතුරෙන් 1/3 නූල් මතුවීම පෙන්වන හීරි රටා තෝරන්න.

A B C D



(1) A, B (2) C, D (3) A, B, C (4) A, B, C, D

**26.** යන්ත්‍රයක විවීමේදී රටාවට අනුව නූල් ඇද ගැනීම කළ යුතු ය. රටාවට අනුව නූල් ඇදීමට ආධාර වන යන්ත්‍රයේ ඇති උපාංගය වන්නේ,
(1) පුඩුවැල් පේළි ය. (2) පනාව ය. (3) අළුව ය. (4) නඩාව ය.

**27.** හැදයක් දිග් ගැසීම සඳහා $2/80^s$ දෙපට නූල් භාවිත කරන ලදී. එම අංකනයෙන් යුතු නූල් කිලෝග්‍රෑම් 4ක නූල් කැරළි කීයක් තිබේ ද?
(1) $\frac{40 \times 2}{4} = 20$ (2) $\frac{80 \times 2}{4} = 40$ (3) $\frac{80 \times 4}{2} = 160$ (4) $\frac{80 \times 4}{4} = 80$

**28.** අත්පිස්නා හැදයක් සඳහා දිග සෙන්ටිමීටර 36ක් සහ පළල සෙන්ටිමීටර 48 හැදයක් දමා තිබේ. එහි එක් සෙන්ටිමීටරයට නූල් පොටවල් 30 බැගින් යොදා තිබේ. හැදය තුළ ඇති නූල් පොටවල් ගණන කීයද?
(1) $48 \times 36 = 1728$ (2) $48 \times 30 = 1440$ (3) $36 \times 30 = 1080$ (4) $36 \times 36 = 1296$

**29.** විවීමේ තාක්ෂණයේ දී භාවිතයට ගැනෙන අත් යන්ත්‍රවල දක්නට ලැබෙන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A - වාඩි වීම සඳහා ආසනයක් සකසා තිබීම
B - නඩාව දිවවීමට අත්වැලක් තිබීම
C - පාපොලු සහ හරස් පොලු දෙවර්ගයම භාවිත කිරීම
D - අලංකාර විසිතුරු වාටි මෝස්තර යෙදීමේ හැකියාව
මේ අතුරෙන් ජවනඩා යන්ත්‍රයේ ඇති විශේෂතා දැක්වෙන්නේ,
(1) A, B සහ C වලිනි. (2) A, B සහ D වලිනි. (3) A, C සහ D වලිනි. (4) B, C සහ D වලිනි.

**30.** කෙඳි හඳුනාගැනීමේ සරල පරීක්ෂණයක් වන ස්පර්ශ කිරීමේ පරීක්ෂාවේ දී උණුසුම් බවක් දනවන උඩට තෙරපෙන සුළු ස්වභාවයක් ඇති ඇදෙන සුළු කෙඳි වර්ගය වන්නේ,
(1) ලෝම ය. (2) සේද ය. (3) පොලියෙස්ටර් ය. (4) කපු ය.

**31.** මාතෘ පාෂාණය භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක බලපෑම්වට ලක්වී දිරාපත් වී ඇලුමිනා සිලිකේට් බවට පත් වේ. මෙම මැටිවල භාණ්ඩ නිෂ්පාදනයට සුදුසු වන්නේ,
(1) mm 0.002 ට වඩා කුඩාකලීලමය අංශු ඇතුළත් මැටි ය.
(2) mm 2.002 ට වඩා කුඩාකලීලමය අංශු ඇතුළත් මැටි ය.
(3) mm 0.202 ට වඩා කුඩාකලීලමය අංශු ඇතුළත් මැටි ය.
(4) mm 2.220 ට වඩා කුඩාකලීලමය අංශු ඇතුළත් මැටි ය.




Department of Examinations Sri Lanka

**32.** මැටි භාණ්ඩ නිෂ්පාදකයින් භාණ්ඩයේ ප්‍රමිතිය රැකගැනීම සඳහා අවශ්‍යතාව අනුව විවිධ දේ මිශ්‍ර කරගනු ලැබේ. යකඩ ප්‍රතිශතය අඩු කෙඔලින් වැනි මැටි වර්ග එකතු කරගනු ලබන්නේ,
(1) සච්ඡිද්‍රතාව අඩු මැටි සඳහා ය. (2) සුවිකාර්යතාව අධික මැටි වර්ග සඳහා ය.
(3) නිල්, කළු වැනි වර්ණ ඇති මැටි වර්ග සඳහා ය. (4) හැකිළීමේ ප්‍රතිශතය අඩු මැටි වර්ග සඳහා ය.

**33.** පිළිස්සීමට පෙර මෙන්ම පිළිස්සීමෙන් පසුව ද සුදුපැහැයෙන් දිස්වන වටිනා මැටි විශේෂයක් ලෙස සැලකෙන කෙඔලින් මැටි නිධි ශ්‍රී ලංකාවේ පිහිටා ඇත්තේ,
(1) දෙදියවල සහ මොලගොඩ ය. (2) අරණායක සහ ඔඩ්ඩුසුඩාන්වල ය.
(3) බොරලැස්ගමුව සහ මීටියාගොඩ ය. (4) කැළණිය සහ බියගම ය.

**34.** මැටි භාණ්ඩ නිෂ්පාදනයේ දී මැටි අංශුවක අංශුමය පරිමාව අඩු වැඩි වීම මත නිර්මාණය කරන භාණ්ඩය තීරණය කෙරේ. ගුරුලේත්තු, මැටි කල වැනි භාණ්ඩ නිපදවීමට ඉතා සුදුසු මැටි වර්ගය වන්නේ,
(1) පැහැපත් වර්ණයෙන් යුත් ප්‍රාථමික මැටි ය. (2) හැකිළීමේ ප්‍රතිශතය අඩු කෙඔලින් මැටි ය.
(3) පිහිටි තැනම තැන්පත්ව ඇති පිහිටි මැටි ය. (4) සච්ඡිද්‍රතා ගුණයෙන් ඉහළ ද්විතීයික මැටි ය.

**35.** පහත දැක්වෙන මැටි භාණ්ඩ නිපදවීමට විවිධ නිෂ්පාදන ක්‍රම භාවිත කර ඇත.




*A* *B* *C* *D*

මේවා අතුරෙන් මැටි තහඩු භාවිතයෙන් නිපදවා ඇති භාණ්ඩ වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) A හා D ය. (4) B හා C ය.

**36.** මැටි භාණ්ඩ අලංකරණයේ දී මුද්‍රා මගින් ගිල්ලුම් මෝස්තර යෙදීම සිදු කරනු ලබන්නේ,
(1) නිෂ්පාදන අවස්ථාවේ දී ය. (2) පිළිස්සීමෙන් පසු අවස්ථාවේ දී ය.
(3) හම්පදම් අවස්ථාවේ දී ය. (4) දිස්න යොදන අවස්ථාවේ දී ය.


**37.** රූප සටහනේ දැක්වෙන්නේ අච්චු භාවිතයෙන් නිපදවා ගත් සෙරමික් භාණ්ඩයකි.
මෙම භාණ්ඩය සකස් කර ඇත්තේ කුමන අච්චු ක්‍රමය භාවිතයෙන් ද?
(1) සරල අච්චුවකිනි.
(2) සංකීර්ණ අච්චුවකිනි.
(3) කැබලි දෙකේ අච්චුවකිනි.
(4) තනි පලුවේ අච්චුවකිනි.



**38.** විවිධ අලංකරණ ක්‍රම භාවිත කරමින් මැටි භාණ්ඩ අලංකාර කර ගැනේ. එසේ අලංකාර කරගත් මැටි භාණ්ඩ සුරක්ෂිත කර ගැනීම සඳහා කළයුතු වන්නේ,
(1) පෙර පිරියම් ක්‍රමයක් යෙදීම ය. (2) අව්වේ තබා වියළා ගැනීම ය.
(3) අච්චුසිවලින් ආරක්ෂා කර ගැනීම ය. (4) පසු පිරියම් ක්‍රමයක් යෙදීම ය.

**39.** මැටි භාණ්ඩ නිෂ්පාදනයේ දී පිළිස්සීමේ අවස්ථා කිහිපයකි. තිදුලතටු පිළිස්සීම (bisque firing) අවසාන පිළිස්සීම ලෙස සැලකෙන භාණ්ඩ කාණ්ඩය වන්නේ,
(1) නාන කාමර උපාංග ඇතුළත් සනීපාරක්ෂක භාණ්ඩ ය.
(2) වලං කලගෙඩි වැනි මුළුතැන්ගෙයි භාණ්ඩ ය.
(3) බිම් ගඩොල්, පිගන් ගඩොල් වැනි ඉදි කිරීමේ භාණ්ඩ ය.
(4) පීරිසි, පිගන්, දීසි, කෝප්ප වැනි ආහාර පාන සඳහා වන භාණ්ඩ ය.

**40.** දේශීය පෝරණුවක හරස්කඩ පෙනුමේ දළ සටහනක් මෙහි දැක්වේ. එහි අංක 1, 2, 3, 4 යනුවෙන් අංක කර ඇති කොටස්වල නිවැරදි අනුපිළිවෙළ වන්නේ,
(1) ලිප, මැටි තට්ටුව, අමු භාණ්ඩ හා පිදුරු තට්ටුව ය.
(2) ලිප, අමු භාණ්ඩ, පිදුරු තට්ටුව හා මැටි තට්ටුව ය.
(3) අමු භාණ්ඩ, ලිප, මැටි තට්ටුව හා පිදුරු තට්ටුව ය.
(4) පිදුරු තට්ටුව, මැටි තට්ටුව, ලිප හා අමු භාණ්ඩ ය.






Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

84 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ශිල්ප කලා I, II
நுண்கலை I, II
Arts and Crafts I, II

## ශිල්ප කලා II

* **පළමුවැනි** ප්‍රශ්නය ද තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** පාසල හා ප්‍රජාවේ අන්තර් සුහදතාවය වර්ධනය කිරීම උදෙසා ප්‍රාදේශීය නිෂ්පාදන අළෙවි පොළක් සහ ප්‍රදර්ශනයක් පැවැත්වීමට කලාප අධ්‍යාපන කාර්යාලය තීරණය කර ඇත. ඉදිරිපත් කරන නිර්මාණ ඇගයීමට ලක් කර ත්‍යාග පිරිනැමීමට ද අපේක්ෂිත ය.

(i) අළෙවි පොළ සහ ප්‍රදර්ශනය පිළිබඳ දැනුවත් කිරීම සඳහා 10 cm දිග 8 cm පළල සෘජුකෝණාස්‍රාකාර පෝස්ටරයක් නිර්මාණය කරන්න.

(ii) ප්‍රදර්ශන භූමියට ඇතුල් වන දොරටුව සඳහා සුදුසු තොරණක් සකස් කිරීමට භාවිත කළ හැකි පරිසර හිතකාමී අමුද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

(iii) ආරාධිතයින් උදෙසා යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක ආකෘතියක් ඇඳ දක්වන්න.

(iv) ප්‍රදර්ශනයට තැබීමට සකස් කරන නිර්මාණ සඳහා භාවිත කළ හැකි කෙඳි වර්ග **හතරක්** නම් කරන්න.

(v) සංවිධායක කමිටුවට පැළඳීම සඳහා ත්‍රිකෝණාකාර හැඩැති නිල ලාංඡනයක ආකෘතියක් නිර්මාණය කරන්න.

(vi) මල් වගාකරුවන්ගේ කුටියේ මලින් කරන නිර්මාණ තැබීමට අපේක්ෂා කෙරේ. මල් කල් තබා ගැනීමේ ක්‍රමයක් දක්වන්න.

(vii) නර්තන කණ්ඩායම් සාමාජිකයින්ගේ ගෙල සැරසීමට සුදුසු ගෙල පළඳනාවක් ඇඳ දක්වන්න.

(viii) ආබාධිත මවක් තම ගෙතුම් නිර්මාණ අළෙවි කර ගැනීම සඳහා අළෙවි කුටියක් වෙන් කරගෙන ඇත. එහි දී මිල දී ගත හැකි වූල් නිර්මාණ **දෙකක්** නම් කරන්න.

(ix) මැටි ආශ්‍රිත නිෂ්පාදන වෙළෙඳ කුටියෙන් මිල දී ගත හැකි විසිතුරු භාණ්ඩ **දෙකක්** නම් කරන්න.

(x) ජයග්‍රාහකයින් සඳහා පිරිනැමෙන ත්‍යාග අසුරනු ලබන්නේ සිලින්ඩරාකාර ඝන කඩදාසි නිමැවුමක ය. ඒ සඳහා සුදුසු සිලින්ඩරයක විකසනය අඳින්න.


**2.** වියන ලද රෙදිවල ආර්ථික වටිනාකම හා විචිත්‍රවත් භාවය වර්ධනය කරලීම සඳහා පිළි අලංකරණ ක්‍රම භාවිතයට ගැනේ.

(i) සරමක් බතික් කිරීම සඳහා සුදුසු වාටි මෝස්තරයක ඒකකයක් අඳින්න.

(ii) පිළි අලංකරණය කිරීමකට ලක් කළ පසු එහි පැවැත්ම සඳහා පසු පිරියමක් යොදනු ලැබේ. පසු පිරියම් ක්‍රම **දෙකක්** නම් කර එයින් **එක්** ක්‍රමයක් විස්තර කරන්න.

(iii) අච්චු මුද්‍රණ ක්‍රමයට සුදුසු මෝස්තරයක් ඇඳ එය භාවිත කර ළදරු ඇඳුමක් අලංකාර කර ගන්නා ආකාරය විස්තර කරන්න.

**3.** සන්නිවේදන මාධ්‍යයේ එක් අංගයක් වන ලිපි ලේඛන හුවමාරුව සඳහා තැපැල් කාර්යාල අභියස ඇති ලියුම් පෙට්ටියක රූප සටහනක් මෙහි දැක්වේ.



(i) ලියුම් පෙට්ටියේ දක්නට ලැබෙන ජ්‍යාමිතික හැඩතල **හතරක්** නම් කරන්න.

(ii) නිල ලාංඡනය දැක්වෙන රූපය ඇඳීමට ඒක කේන්ද්‍රික වෘත්ත දෙකක් භාවිත කර ඇත. කුඩා වෘත්තය අරය 2 cm වූ ද විශාල වෘත්තයේ අරය 4 cm වූ ද ඒක කේන්ද්‍රික වෘත්ත **දෙකක්** නිර්මාණය කරන්න.


(iii) ලියුම් පෙට්ටියේ බඳ කොටසේ විකසනය ඇඳ දක්වන්න.

[හත්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**4.** බඳුන් පලසක් වියා ගැනීම සඳහා සකස් කරන ලද හැදයක දළ සැලැස්ම සහ විස්තර පහත දැක්වේ.

- ✻ හැදයේ දිග මීටර 100 කි.
- ✻ හැදයේ පළල සෙන්ටිමීටර 40 කි.
- ✻ එක් සෙන්ටිමීටරයක දික් නූල් පොටවල් ගණන 60 කි.
- ✻ නූලේ නොම්මරය $^{2}/_{40^s}$ කි.
- ✻ මුළු හැදයම රතු නූලෙන් දිග් ගසා ඇත.
- ✻ හරස් නූල් රෝස පාටින් යෙදේ.




(i) හැදයට අවශ්‍ය දික් නූල්/රතුනූල් පොටවල් ගණන කීය ද?

(ii) මෙම බඳුන් පලස් හැදය විවීමට සුදුසු වියමන් රටා **දෙකක්** නම් කර, ඒවායේ නූල් මතුවන ආකාරය ඒකක **දෙක** බැගින් ඇඳ දක්වන්න.

(iii) හැදයට අවශ්‍ය දික් නූල් ප්‍රමාණයේ බර සොයන්න.

**5.** තාක්ෂණයේ දියුණුවත් සමග රෙදි නිෂ්පාදනයේ බොහෝ කාර්යයන් සඳහා යන්ත්‍ර සූත්‍ර බිහි විය.

(i) විවීමේ යන්ත්‍රයක කොටස් **දෙකක්** නම් කර ඒවායින් කෙරෙන කාර්යයන් විස්තර කරන්න.

(ii) විවීමේ යන්ත්‍රයක රටාව අනුව නූල් ඇද ගැනීම සිදු කෙරෙන උපාංගය දළ රූප සටහනකින් ඉදිරිපත් කරන්න.

(iii) ජවනඩා යන්ත්‍රයක කොටස් **දෙකක්** නම් කර ඒවායින් කෙරෙන කාර්යයන් විස්තර කරන්න.

**6.** අච්චු භාවිත කිරීමෙන් සමානරූපී භාණ්ඩ රාශියක් කෙටි කාලයකින් නිපදවා ගැනීමේ හැකියාව ඇත.

(i) තනි පලුවේ අච්චු සෑදීමට සුදුසු භාණ්ඩ **දෙකක්** ලියන්න.

(ii) සංකීර්ණ අච්චු යනු මොනවා' දැයි හඳුන්වා ඒ සඳහා උදාහරණ **දෙකක්** දෙන්න.

(iii) සකපෝරුවේ භාණ්ඩ ඉදිකරන ආකාරය සැකෙවින් දක්වන්න.

**7.** වර්තමානයේ උද්‍යාන අලංකරණය පිළිබඳ දැඩි අවධානයක් යොමු වී ඇත.

(i) උද්‍යාන විද්‍යා මූලධර්ම **දෙකක්** නම් කරන්න.

(ii) පිළිස්සීමෙන් පසු මැටි භාණ්ඩවල ඇතිවන ගුණාංග **හතරක්** දක්වන්න.

(iii) මැටි භාණ්ඩ අලංකරණය සඳහා භාවිත වන සම්ප්‍රදායික අලංකරණ ක්‍රම **දෙකක්** නම් කර ඒවා පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

✻ ✻ ✻

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka